සන්නස
SANNASA




# නායකතුමාගෙන්, කරුණාගේ "වල් පැළෑටි ඉවත් කිරීමේ මෙහෙයුමක"

## සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

2004 වසරේ අප්‍රේල් මාසයේදී විමුක්ති කොටි සංවිධානයේ කරුණා අම්මාන්ගේ වෙන්වීම සිදුවන අවස්ථාවේ මම එම මාසයේ පැවැත්වීමට නියමිත මහ මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී සිටියෙමි. දෙමළ සංවිධානයක් ඇති කර, කොටින්ගේ සහායෙන් ඔවුන්ව මැතිවරණයෙන් ජයග්‍රහණය කරවීමත්, එම මාර්ගයෙන් දෙමළ ජනයාගේ ශක්තිය පවතින්නේ කොටින්ව ප්‍රමුඛ කරගෙනය යන අදහස ප්‍රකාශ කිරීමෙන් පාර්ලිමේන්තු තීරණවලදී තම බලපෑම ස්ථාපිත කිරීමත් කළ හැකිය යනුවෙන් කොටි අදහස් කළහ. එවක යාපනය දිස්ත්‍රික්කයෙහි දේශපාලන අංශය භාරව කටයුතු කළේ ඉලම්පරිදි නම් තැනැත්තාය. මා සහ තවත් කීප දෙනෙක් ඔහුට සහාය දැක්වීම සඳහා වන්නියෙහි සිට එහි ගොස් සිටියෙමු.

දිනක් උදෑසන හයට පමණ සටන්කාමීන් සඳහා හදිසි රහසිගත රැස්වීමක් ඉලම්පරිදි කැඳවා තිබුණි. ''ඉතා වැදගත් කාරණයක් ඔබලාට දැනුම් දෙන්න ඕනෑ. මේක කිලිනොච්චියෙන් ලැබුණු හදිසි දැනුම් දීමක්. අපේ සංවිධානයේ මඩකලපුව-අම්පාර සෙන්පති කරුණා අම්මාන් එයත් එක්ක ඉන්න දහස් ගණනක් සටන්කාමීන් එක්ක සංවිධානයෙන් අයින් වෙන බව දැනුම් දීලා තියෙනවා.'' යනුවෙන් ඉලම්පරිදි එම පුවත දැනුම් දුන්නේය.

සියලු දෙනාම ගල් ගැසී තම අසුන්වල උන්හ. එම වචන සවනත වැකුණු පසුව එහි කතා වූ කිසිම දෙයක් මගේ සවන්වලට දැනුණේ නැත. මුළු සංවිධානයම විනාශ වී ගියා සේ හැඟුමක් මා තුළ ඇති විය. මක්නිසාද යත් එවන් බලගතු ශක්තියක් නැගෙනහිර පළාතේ සටන්කාමීයෝ විමුක්ති කොටි සංවිධානයෙහි හමුදාමය ශක්තිය තුළ පිළිබිඹු කළ බැවිනි. කිලිනොච්චියෙහි සිට ඊළඟ නිවේදනය ලැබෙන තෙක් මැතිවරණ ප්‍රචාරක මහජන රැළි නතර කරන මෙන් දැනුම් දුන්නේය. යාපනයේ කොක්කුවිල් පොට්පදී වීදියේ පිහිටා තිබූ අපේ කඳවුරු තුළ දින දෙකක් මුළුමනින්ම කිසිවක් කිරීමට හිතක් නොමැතිව ජනතාවගෙන් නැගෙන ප්‍රශ්න කන්දරාවට පිළිතුරු දීමට නොහැකිව මුළුගැන්වී උන්නෙමු.

ජනතාවට සැපයිය යුත්තේ කුමන පිළිතුරක්ද යන්න ඉතාමත් දුෂ්කර තත්ත්වයක් ඇති කළේය. පසුදින කිලිනොච්චියේ දේශපාලන අංශ භාරකරුගේ රැස්වීමට අපව කැඳවා තිබුණි. එම රැස්වීමේදී මුල්‍ය ප්‍රශ්න සහ පුද්ගලික විනය ප්‍රශ්න ගැන මඩකලපුව-අම්පාර සෙන්පතිගෙන් ප්‍රශ්න කිරීමට නායකතුමා ඔහුට වන්නියට පැමිණෙන ලෙස දැනුම් දී තිබූ මොහොතේ එලෙස පැමිණීම ප්‍රතික්ශේප කරමින් දැනුම්දීමක් කර ඇති බවත්, එම නිසා ඔහුව විමුක්ති කොටි සංවිධානයෙන් ඉවත් කර ඇති බවත්, ඔහු විසින් රඳවා ගනු ලැබ සිටින සටන්කාමීන්ව මුදා ගැනීමේ කටයුතුවල සංවිධානය ක්‍රියාත්මක වන බවත් දැනුම් දුන්නේය.

මෙම හේතුව නිසා සටන්කාමීන් කැළඹීමට පත් නොවිය යුතු බවත්, තම අරගල ජීවිතය තුළ මෙවැනි බොහෝ අර්බුද පසුකරමින් ජයග්‍රාහීව ඉදිරියට පැමිණි ප්‍රභාකරන් නායකතුමා මෙම අර්බුදයත් ජය ගන්නා බවත්, ඒ විශ්වාසයෙන් ජනතාවගේ ප්‍රශ්නවලට පැහැදිලි සිතින් උත්තර දෙන ලෙසත් දේශපාලන අංශ භාරකරු අප වෙත දැනුම් දුන්නේය.

### සංවිධානයේ නියෝජ්‍ය නායකයාව සිට පසුව



සංවිධානය විසින්ම අත්අඩංගුවට ගනු ලැබ අතුරුදහන් කළ මාත්තයා අය්යා පිළිබඳ මතකය එවිට මා තුළ නැවතත් ඇති විය. යමෙකු සඳහා වන දඬුවම මෙය යැයි සංවිධානය තීරණය කළහොත් ඔහු මත එල්ල කෙරෙන චෝදනා වන්නේ නායකතුමාට එරෙහිව කුමන්ත්‍රණය කිරීම, සංවිධානයේ මුදල් අයථා භාවිතය, ලිංගික වැරදි යනාදි යයි. ආරම්භයේදී අනෙකුත් සටන්කාමී සංවිධාන තහනම් කිරීමටත් මෙවැනි චෝදනා එම සංවිධාන වෙත එල්ල කෙරුණු බව මම දැනගෙන සිටියෙමි.

ඇත්තෙන්ම නැගෙනහිර පළාතේ සෙන්පති සහ සංවිධානයේ නායකතුමා අතර සිදුවූයේ කුමක්ද යන්න ගැන මට පමණක් නොව, බහුතරයක් සටන්කාමීන්ටද නිවැරදි වැටහීමක් හෝ අවබෝධයක් හෝ නොතිබූ බව රහසක් නොවීය. එහෙත් ප්‍රභාකරන් නායකතුමා කරුණා අම්මාන් මත අචල විශ්වාසයක් සහ පුද්ගලික වශයෙන් ඇල්මක් සහිතව උන්නේය යන්න පමණක් මට ස්ථිරවම කිව හැකිය.

දිනක් මමත් සෙන්පති දුර්ගා යන අයත් නායකතුමාගේ කැඳවීමක් මත ඔහු හමුවීමට ගියෙමු. එය සාම සාකච්ඡාවල ආරම්භක කාලයයි. එහිදී නායකතුමා බොහෝ කරුණු අප සමඟ කතාබහ කරමින් උන්නේය. එහිදී නායකතුමා එක් අවස්ථාවකදී මෙසේ කීවේය.

''මඩකලපුව-අම්පාර ප්‍රදේශවල සටන්කාමියෝ අරගලයේදී විශාල දුෂ්කරතා විඳලා තියනවා. ඒ පවුල්වලටයි ජනතාවටයි අපි සෑහෙන දේවල් කරන්ඩ ඕනෑ. මුල්‍ය අංශය මාර්ගයෙන් යම්තාක් දුරකට මුදල්වලින් උදව් කරන්ඩ කියලා කරුණාටත් කියලයි තියෙන්නේ. එයා ඒක කරනවා. මේ පොට්ටු අම්මාන් එහෙම තමයි මගේ ළඟට ඇවිල්ලා අරක වැරදියි, මේක වැරදියි කිය කියා ඉන්නේ. ඉස්සරවෙලා සෙන්පතිවරු සමඟියෙන් ඉන්න ඕනෑ.''

මඩකලපුව-අම්පාර සෙන්පති කරුණා සහ කොටි සංවිධානය සමඟ ඇතිවූ ගැටලුවලට පසුව එහි සිටි සමහර සටන්කාමීහු සංවිධානයේ නායකත්වය කෙරෙහි වූ විශ්වාසය හේතුවෙන් වන්නියට පැමිණියහ. ඔවුන්වද එක්රැස් කරගෙන 'නැගෙනහිර පළාතේ සටන්කාමීන්ව මුදාගැනීමේ ක්‍රියාන්විතය' යන නමින් සංවිධානය ඇතුළේම ඉතාමත් කුරිරු 'සහෝදර යුද්ධයක්' සිදු කළේය.

වසර ගණනාවක් තිස්සේ මම ආශ්‍රය කළ බොහෝ සටන්කාමීහු මෙම සහෝදර යුද්ධයේදී දෙපාර්ශ්වයෙන්ම මිය ගියහ. සංවිධානය පිළිබඳ විශ්වාසයෙන් පැමිණ භාර වී සිටි මඩකපුව-අම්පාර කාන්තා සෙන්පති සප්තනී (චාලි) ඇතුළු සටන්කාමී සහෝදරියෝ සිවු දෙනෙකුද ඇතුළත්ව බොහෝ සෙන්පතිවරුන්ට සංවිධානයේ බුද්ධි අංශයේ සිරගෙවල්වල සිරකර තබා පසුව මරණ දඬුවමට ලක් කළ බව දැන ගන්නට ලැබුණි. සංවිධානයේ සටන්කාමී ශක්තිය මෙවැනි ම්ලේච්ඡ 'වල් පැළෑටි ඉවත් කිරීමේ' කටයුතුවලින්ද විනාශ වන්නට පටන් ගත්තේය.

විමුක්ති කොටි සංවිධානයේ දිගු කාලීන සාමාජිකයන්ව සිටි සටන්කාමීහු බොහෝ දෙනෙක් යුද්ධ පෙරමුණෙහි මහත් තුවාල ලැබ සිටියහ. එමෙන්ම මධ්‍යම පෙළ සටන්කාමීහු බොහෝ දෙනෙක් පෞද්ගලික හේතු ඉදිරිපත් කරමින් සංවිධානයෙන් ඉවත්ව ගියහ. මා දන්නා තරමින් බොහෝ සටන්කාමී සහෝදරයෝ සහ සහෝදරියෝ තම පවුලෙහි ආර්ථික දුගී බව සහ මවුපියන්ගේ බල කිරීම හේතුවෙන් සංවිධානයෙන් ඉවත් වූහ. තවත් සමහර සටන්කාමීහු ප්‍රේමය, විවාහය වැනි සම්බන්ධතාවන් ඇති කරගත්හ. ප්‍රහාරක බළඇණිවල අත්දැකීම් බහුල සටන්කාමීන්ගේ ප්‍රතිශතය මෙම හේතුව නිසා අඩුවන්නට විය.

තිස්වසරක අරගලයේ ශේෂයන් ලෙසින් තුවාල ලැබූ සටන්කාමීන්ද, දුෂ්කර පුහුණුවීම්වල යෙදිය නොහැකි වයසට ගිය අරගලකරුවන්ද පමණක් ඉතිරිව උන්හ. ඔවුහු තම යොවුන් බවද, ශරීර ශක්තියද රටෙහි නිදහස උදෙසා වැය කළ අය වූහ. දරුණු තුවාල ලබා අක්‍රිය තත්ත්වයක සිටි සටන්කාමී කාන්තාවෝ සහ පිරිමි ''අපි ගැන කවුරු හෙව්වෙ බැලුවෙ නැතත් අය්යා (නායකතුමා) අපිව අතහැර දමන්නේ නෑ'' යැයි දැඩි විශ්වාසයකින් සිටියහ. සංවිධානය විසින් කරනු ලබන නියෝග ඇතැම් අවස්ථාවල සිතට එකඟ නොවන ඒවා වුවත්, බොහෝ සටන්කාමීහු සහ වගකීම්භාර පිරිස් පවසන දෙයක් වූයේ ''අය්යානේ කියන්නේ. කරන්න තමයි ඕනෑ. කොයි දෙයටත් අය්යා සැළැස්මක් ඇතිවයි ඉන්නේ'' යන්නයි. අපේ සංවිධානයෙහි නායකයා පිළිබඳ දැඩි විශ්වාසය සටන්කාමීන්, අපට හිතවත් ජනතාව ආරම්භයෙහි සිට පවත්වාගෙන ආ බව මම දනිමි. ඔහුව දෙවියෙකුට සමානව සලකා කටයුතු කළ අයද වූහ.

බොහෝ දෙනෙක් මෙය පුද්ගලාභිවන්දනය යැයි පවසා දොස් කියන්නට වූහ. සත්‍යද එයමයි. එය අපගේ සංස්කෘතිය සමඟද සිරිත් විරිත් සමඟද එක්ව පැමිණි කරුණක් යැයි මම සිතමි. මා ඇතුළු දහස් ගණනක් සටන්කාමීහු නායකතුමා දෙස බැලුවේ මහත් අර්බුධවලට මුහුණ දී අරගලයක් අවුරුදු තිහකටත් වඩා කාලයක් මහත් බළසේනා ශක්තියක් සමඟ ගොඩනැංවූ අයෙක්ය යන උදාරත්වය සමඟිනි. නායකතුමා ගත් බොහෝ තීරණ විවේචනයට ලක්වන අවස්ථාවලදී ඔහු ජනයාගේ යහපත උදෙසාත්, රටේ විමුක්තිය උදෙසාත් මෙවැනි තීරණ ගෙන ඇතැයි යනුවෙන් ද, නායකතුමා යම් තීරණයක් ගතහොත් අනිවාර්යෙන්ම එයට යුක්ති සහගත හේතුවක් ඇතැයි යනුවෙන්ද සෑම සටන්කාමියෙක්ම කිසිම සැකයකින් තොරව විශ්වාස කළේය. නායකතුමා ගන්නා තීරණ විවේචනය කිරීම හෝ ප්‍රශ්න කිරීම හෝ දේව අපරාධයක් හා සමාන ලෙසින් සංවිධානය තුළ සැලකිණි. අභ්‍යන්තර විවේචන ඇති කර සංවිධානය ඉතාමත් ඛේදජනක අවසානයක් කරා ගෙන යාමට මඟ සැකසුවේ මෙම ප්‍රවණතාවයි. සියල්ලම ඔහු යැයි පවසා ගුණ වැනුවා පමණක් නොව අවසාන පරාජයටත් ඔහුව හේතුව යැයි චෝදනාව ඉතිහාසය විසින් එල්ල කිරීමට එය හේතුවිය.